# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2167/19 - 2020 මාර්තු මස 21 වැනි සෙනසුරාදා - 2020.03.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

24 (3) යටතේ නියමය

I. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (1) වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2167/12 හා 2020 මාර්තු මස 20 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකළ දැන්වීම මගින් මෙහි වූ උපලේඛනයේ සඳහන් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම 2020 අප්‍රේල් මස 25 වැනි සෙනසුරාද දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා පවත්වනු ලබන බව නියමකර ඇතිමුත්, ශ්‍රී ලංකාව තුළ පැතිරී යන COVID - 19 ව්‍යසන තත්ත්වය හේතුවෙන් මතු සඳහන් උපලේඛනයේ දැක්වෙන මැතිවරණ කොට්ඨාසවල ඡන්ද විමසීම 2020 අප්‍රේල් මස 25 වන දින පැවැත්වීමට නොහැකිවී ඇති බව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (3) වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

II. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම් දිනය ලෙස 2020 අප්‍රේල් මස 30 වන දිනය පසුවී දින දහහතරකට පසු දිනයක් නියම කරනු ලැබෙනු ඇති බවත් එම දිනය පසුව නිකුත් කරනු ලබන ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එන්. ජේ. අබේසේකර,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. රත්නජීවන් එච්. හූල්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2020 මාර්තු මස 21 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

1A - PG 4956 — 267 (2020/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම**

1. කොළඹ
2. ගම්පහ
3. කළුතර
4. මහනුවර
5. මාතලේ
6. නුවරඑළිය
7. ගාල්ල
8. මාතර
9. හම්බන්තොට
10. යාපනය
11. වන්නි
12. මඩකලපුව
13. දිගාමඩුල්ල
14. ත්‍රිකුණාමලය
15. කුරුණෑගල
16. පුත්තලම
17. අනුරාධපුරය
18. පොළොන්නරුව
19. බදුල්ල
20. මොණරාගල
21. රත්නපුර
22. කෑගල්ල

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.